සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

*2017 අංක 24 දරණ නව ආදායම් පනත අනුව*

---

## ආදර්ශ ප්‍රශ්නය

2000 වර්ෂයේ සංස්ථාපනය කරන ලද **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම,** පොල් කොහු කෙඳි ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ නිරතව සිටියි. 2019 මාර්තු 31 දිනට සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය සහ මුළු සංචිත පිළිවෙලින් රු.12,000,000/- ක් සහ රු.1,850,000/- ක් විය.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | සටහන් | රු.'000 |
|---|---|---|
| අයභාරය - අපනයන | | 632,000 |
| - දේශීය විකුණුම් | | 84,000 |
| | | 716,000 |
| විකුණුම් පිරිවැය | | (486,000) |
| දළ ලාභය | | 230,000 |
| වෙනත් ආදායම් | 1 | 6,598 |
| පරිපාලන වියදම් | 2 | (134,500) |
| බෙදාහැරීමේ වියදම් | 3 | (54,450) |
| මූල්‍ය පිරිවැය | 4 | (7,654) |
| බදුපෙර ශුද්ධ ලාභය | | **39,994** |

(1) **1 වන සටහන – වෙනත් ආදායම්:**

| | රු.'000 |
|---|---|
| කුලී ආදායම (දළ) | 480 |
| ලැබුණු ලාභාංශ ආදායම (ශුද්ධ) | 215 |
| ඉඩම් විකිණීමේ ලාභය | 5,000 |
| ලැයිස්තුගත කොටස් විකිණීමේ ලාභය | 468 |
| ස්ථාවර තැන්පතු මත පොලිය (දළ) | 435 |
| | **6,598** |

(2) **2 වන සටහන – පරිපාලන වියදම්:**

පරිපාලන වියදම් තුළ පහත ඒවාද ඇතුලත් වේ:

(2.1) වර්ෂය සඳහා ගිණුම්කරණ ක්ෂය රු.5,436,000/- කි.

(2.2) ව්‍යාපාරය සඳහා භාවිත කරන ලද ලොරි රථය විකිණීමෙන් සමාගමට රු.120,000/- ක ගිණුම්කරණමය අලාභයක් දැරීමට සිදුවිය.

(2.3) වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදනය රු.1,876,000/- කි.

(2.4) වර්ෂය සඳහා ගෙවන ලද අධ්‍යක්ෂක ගාස්තු රු.2,400,000/- ක් වන අතර, එය උපයනවිට ගෙවීමේ බද්ද (PAYE) සඳහා සැලකිල්ලට ගෙන නොමැත.

(2.5) සංග්‍රහ වියදම් රු.135,000/- කි.

(2.6) වර්ෂය තුළදී, සෞඛ්‍ය රෙගුලාසි උල්ලංඝනය කිරීම නිසා දණ්ඩන වශයෙන් රු.250,000/- ක් ප්‍රාදේශීය සභාවට ගෙවා ඇත.

(2.7) සමාගම, වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.1,000,000/- ක් පිළිකා රෝහලට පරිත්‍යාග කර ඇත. (මේ සඳහා රෝහල, ලදුපතක් නිකුත්කර තිබේ) නිවාසයක් පවත්වාගෙන යන අනුමත පුණ්‍යායතනයකට රු.200,000/- ක් වටිනා භාණ්ඩ ද පරිත්‍යාග කර තිබේ.

(2.8) භාණ්ඩවල ගුණාත්වය වැඩිදියුණු කිරීම සඳහා රු.2,500,000/- ක පිරිවැයක් දරමින් සමාගම විසින් පර්යේෂණයක් සිදුකරන ලදී. පර්යේෂණය සිදුකිරීම සඳහා මිලට ගත් රු.1,000,000/- ක් වටිනා රසායනාගාර උපකරණ ද මෙම පිරිවැයෙහි ඇතුලත් වේ.

(2.9) අනාගත ගැනුම්කරුවන් සමඟ සාකච්ඡා කිරීම සඳහා සමාගම විසින් අලෙවි කණ්ඩායමක් සිංගප්පූරුවට යවන ලදී. මෙම කණ්ඩායම සඳහා මිලට ගත් ගුවන් ටිකට්පත්වල පිරිවැය රු.248,000/- කි. තවද, කළමනාකාර අධ්‍යක්ෂකවරයා සහ ඔහුගේ පවුල වෙනුවෙන් සංවිධානය කළ විදේශ සංචාරය සඳහා රු.600,000/- ක් දරණ ලදී.

(2.10) සමාගම කුලියට දී ඇති ගොඩනැගිල්ලෙහි තීන්ත ආලේප කිරීම සඳහා රු.145,000/- ක් දරා තිබේ.

(2.11) 2018 දෙසැම්බර් මාසයේදී, කම්කරු උසාවියේ සමාගම වෙනුවෙන් පෙනී සිටීම සඳහා රු.750,000/- ක් නීතිඥයෙකුට ගෙවා තිබේ. සමාගම, මෙම ගෙවීම මත අදාල වන රඳවාගැනීමේ බද්ද ගෙවා නැත.

(3) **3 වන සටහන – බෙදාහැරීමේ වියදම්:**

බෙදාහැරීමේ වියදම්වල පහත ඒවා ඇතුලත් වේ:

(3.1) සේවකයෙකුගෙන් ලැබිය යුතු ණයමුදලක ඉතිරි වූ රු.50,000/- ලියාහැර ඇත. ඊට අමතරව සමාගම, වෙළෙඳ ණයගැතියන්ගේ අඩමාන ණය වෙනුවෙන් රු.120,000/- ක පොදු ප්‍රතිපාදනයක් කර ඇත. තවද, වර්ෂය තුළදී රු.15,000/- ක වෙළෙඳ ණයක්, අඩමාන ණයක් බවට ඇස්තමේන්තු කර තිබේ.

(3.2) රූපවාහිනී වෙළෙඳ දැන්වීම් පිරිවැය රු.1,520,000/- ක්ද, නව සේවකයන් බඳවා ගැනීම සඳහා පළකළ පුවත්පත් දැන්වීම් පිරිවැය රු.25,000/- ක්ද, ප්‍රචාරණ වියදම්වල ඇතුලත් වේ.

(4) **4 වන සටහන – මූල්‍ය පිරිවැය:**

මූල්‍ය පිරිවැයෙහි පහත දෑ ඇතුලත් වේ:

(4.1) බදු බරක් ලෙස ඉල්ලා සිටිය හැකි කාලසීමාව ඉකුත්වීම නිසා රු.1,057,000/- ක ආර්ථික සේවා ගාස්තු ලියාහරින ලදී.

(4.2) කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ලබාගත් බැංකු ණය සඳහා ගෙවූ ණය පොලිය රු.6,483,000/- කි.

(4.3) 2018 ජූලි 01 දින, මාස 36 ක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ ලැප්ටොප් පරිගණක 5 ක් ලබාගන්නා ලදී. මාසික කල්බදු වාරිකය රු.31,200/- කි. සමාගම වර්ෂය තුළදී වාරික 9 ක් ගෙවා ඇත. ආදායම් ප්‍රකාශයට අයකළ කල්බදු පොලිය රු.114,000/- කි.

(5) **5 වන සටහන – දේපළ, පිරියත සහ උපකරණ:**

(5.1) වර්ෂය තුළදී අත්පත්කර ගැනීම්:

*(රු.'000)*

| **වත්කම් වර්ගය** | **පිරිවැය** |
|---|---|
| ජෙනරේටර් | 2,000 |
| කාර්යාල ලී භාණ්ඩ | 450 |
| කළමනාකාර අධ්‍යක්ෂක සඳහා මෝටර් රථය | 2,800 |
| ලොරි රථය | 4,360 |
| දේශීයව සංවර්ධනය කළ මෘදුකාංග<br>(ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය වර්ෂ 8 කි) | 420 |
| පරිගණක (මූල්‍ය කල්බදු යටතේ ලබාගත්) | 840 |

(5.2) 2018 මාර්තු 31 දිනට පහත වත්කම් විය: *(රු.'000)*

| | **පිරිවැය** | **අත්පත් කරගත් තක්සේරු වර්ෂය** |
|---|---|---|
| ගොඩනැගිලි | 12,465 | 2015/16 |
| යන්ත්‍ර සූත්‍ර | 2,400 | 2016/17 |
| ලොරි රථ | 5,400 | 2016/17 |
| කාර්යාල උපකරණ | 225 | 2017/18 |

(5.3) වර්ෂය තුළදී ඉවත් කිරීම:

(i) 2016/17 තක්සේරු වර්ෂයේදී රු.2,800,000/- කට මිලටගත් ලොරි රථයක්, 2018 ජූනි 30 දින රු.1,750,000/- කට විකුණන ලදී. පැරණි රථය ප්‍රතිස්ථාපනය සඳහා 2018 ජූලි 01 දින රු.4,360,000/- ක පිරිවැයකට නව ලොරි රථයක් මිලදී ගන්නා ලදී.

(ii) සමාගම සතුව නුගේගොඩ පිහිටි ඉඩමක් තිබේ. මෙම ඉඩම 2014 වර්ෂයේදී පැරණි ගොඩනැගිල්ලක් සමඟ රු.25,000,000/- කට මිලට ගෙන ඇති අතර, ගොඩනැගිල්ල සඳහා පිරිවැයක් වෙන්කර නොමැත. දිගුකාලීනව ප්‍රාග්ධන වර්ධනය තුළින් ලාභයක් ලැබීමේ අදහසින් කළමනාකාරිත්වය මෙම ඉඩම ආයෝජන වත්කමක් ලෙස තබාගෙන ඇත. ඉඩම විකුණන තුරු, ගොඩනැගිල්ල කුලියට දී තිබේ. වර්ෂය තුළදී ලැබුනු කුලිය වෙනත් ආදායම් යටතේ වාර්තාකර තිබේ. මෙම ඉඩම 2018 දෙසැම්බර් 31 දින රු.30,000,000/- කට විකුණන ලදී. 2017 සැප්තැම්බර් 30 දිනට මෙම ඉඩමේ වෙළෙඳපොළ වටිනාකම රු.28,000,000/- ක් විය.

(5.4) විශේෂයෙන් ඉහත සඳහන් කර ඇති වත්කම් හැර සියලු වත්කම් බදු සඳහා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබේ.

(6) 2019 මාර්තු 31 දිනට, සමාගමේ පොත්වල පහත වගකීම් විය:

| | රු. |
|---|---|
| බැංකු ණය | 41,700,000 |
| කල්බදු ණයහිමියෝ | 680,000 |
| | **42,380,000** |

(7) වර්ෂය තුළදී විශ්‍රාම ගත් සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික රු.1,345,000/- ක් ගෙවා ඇත.

(8) 2017/18 තක්සේරු වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ බදු සඳහා ව්‍යාපාර අලාභය රු.16,500,000/- කි.

(9) 2018/19 තක්සේරු වර්ෂය සඳහා ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුව [Economic Service Charge (ESC)] රු.3,580,000/- කි.

(10) 2018/19 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ගෙවීම් ලෙස සමාගම රු.1,000,000/- ක් ගෙවා ඇත.

(11) පොලිය, කුලී සහ ලාභාංශ ආදායම මත අදාල අනුපාත යටතේ රඳවා ගැනීමේ බදු අඩුකර තිබේ.

(12) 2017/18 තක්සේරු වර්ෂයේ ආදායම් වාර්තාව අනුව, ඉදිරියට ගෙන ආ මනිමාත්‍ර බදු බැර (Notional tax credit) රු.560,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම** විසින් ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද **තක්සේරු කරන්න**.

--- --- ---

## උත්තරය

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම**

**ආදායම් බද්ද ගණනය කිරීමට සටහන්**

2018/2019 තක්සේරු වර්ෂය (රු.)

| **ව්‍යාපාර ආදායම ගණනය කිරීම** | **සටහන්** | + | - |
|---|---|---|---|
| බද්දට පෙර ලාභය/(අලාභය) | | 39,994,000 | |
| **එකතු කලා:** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මත හිණුම්කරණමය ක්ෂය | | 5,436,000 | |
| ලොරි රථ විකිණීමේ හිණුම්කරණ අලාභය | | 120,000 | |
| පාරිතෝෂික වෙන් කිරීම | | 1,876,000 | |
| අධ්‍යක්ෂක ගාස්තු - PAYE සඳහා සැලකිල්ලට ගෙන නොමැති බැවින් ඉඩ නොදේ - 10 (2) වගන්තිය | | 2,400,000 | |
| සංග්‍රහ වියදම් | | 135,000 | |
| දණ්ඩන | | 250,000 | |
| පරිත්‍යාග (ආදායම් ඉපැයීමට දරණ ලද වියදමක් නොවේ) | | 1,200,000 | |
| පර්යේෂණ සහ සංවර්ධන වියදම් - රසායනාගාර උපකරණ - 15 වන වගන්තිය යටතේ ඉඩ නොදේ - ප්‍රාග්ධන දීමනා ඉඩදේ | | 1,000,000 | |
| විදේශ ගමන් - අලෙවි කණ්ඩායම - ඉඩ දේ | | 0 | |
| විදේශ ගමන් - කළමනාකාර අධ්‍යක්ෂ - ඉඩ නොදේ | | 600,000 | |
| අළුත්වැඩියා සහ වැඩි දියුණු කිරීම් - ආයෝජන ආදායමට අදාල වේ | | 145,000 | |
| නීතිඥයාට ගෙවීම්- රඳවා ගැනීමේ බදු අඩුකර නොමැති බැවින් ඉඩ නොදේ | | 750,000 | |
| සේවක ණය කපා හැරීම් | | 50,000 | |
| අඩමාන ණය වෙන්කිරීම් - විශේෂ | | 15,000 | |
| අඩමාන ණය වෙන්කිරීම - පොදු | | 120,000 | |
| ප්‍රචාරණය - ඉඩදේ | | 0 | |
| ඉඩ නොදෙන ආර්ථික සේවා ගාස්තු | | 1,057,000 | |
| ණය පොලී | 1.1 | 6,483,000 | |
| කල්බදු පොලී | 1.1 | 114,000 | |
| ක්ෂය කල හැකි වත්කම් උපලබ්ධි වීමෙන් තක්සේරු කල හැකි ගාස්තුව (විකිණීමේ ලාභය) | 1.3 | 70,000 | |
| **අඩු කලා: ඉඩදෙන අඩු කිරීම්** | | | |
| ක්ෂය කල හැකි වත්කම් සඳහා ප්‍රාග්ධන දීමනා | 1.2 | | 4,224,000 |
| <u>පර්යේෂණ සහ සංවර්ධන වියදම්:</u> | | | |
| හය වන උපලේඛනය යටතේ අතිරේකව 100% ක් අඩුකල හැක - අන්තර්කාලීන විධිවිධාන | | | 1,500,000 |
| පාරිතෝෂික ගෙවීම් | | | 1,345,000 |
| ඉඩදෙන මූල්‍ය පිරිවැය | 1.1 | | 6,467,800 |
| **අඩුකලා : ආයෝජන ආදායම්** | | | |
| කුලී ආදායම | | | 480,000 |
| පොලී ආදායම | | | 435,000 |
| ලාභාංශ ආදායම | | | 215,000 |
| ලැයිස්තුගත කොටස් ආයෝජන විකිණීමේ ලාභ | | | 468,000 |
| ඉඩම් විකිණීමේ ලාභය | | | 5,000,000 |
| | | **61,815,000** | **20,134,800** |
| | | **41,680,200** | |
| අඩු කලා : ඉදිරියට ගෙන ආ ව්‍යාපාර අලාභය | | **(16,500,000)** | |
| **ව්‍යාපාර ආදායම** | | **25,180,200** | |

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම**

**ආදායම් බද්ද ගණනය කිරීම**

2018/2019 තක්සේරු වර්ෂය

| | | | සටහන් | රු. |
|---|---|---|---|---|
| ව්‍යාපාර ආදායම | | | | 25,180,200 |
| ආයෝජන ආදායම | | | 2 | 2,770,000 |
| **තක්සේරු කළ හැකි ආදායම** | | | | 27,950,200 |
| | | | | |
| **අඩුකළා : සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන** | | | | |
| රජයට කළ පරිත්‍යාග | | | | (1,000,000) |
| අනුමත පුණ්‍යායතනයකට කළ භාණ්ඩ පරිත්‍යාග - ඉඩ නොදේ | | | | - |
| **බදු අයකළ හැකි ආදායම** | | | | **26,950,200** |
| | | | | |
| **ආදායම් බද්ද ගණනය කිරීම** | | | | |
| | සටහන් | බදු අයකළ හැකි ආදායම | අනුපාතය | බද්ද |
| | | රු. | @ | රු. |
| | | | | |
| ආයෝජන වත්කම් උපලබ්ධි කිරීම මත ලාභ | 2.1 | 2,000,000 | **10%** | 200,000 |
| ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද | 3 | 24,950,200 | **14%** | 3,493,028 |
| **ඉතිරි බදු අයකළ හැකි ආදායම** | | 26,950,200 | | **3,693,028** |
| | | | | |
| **අඩු කළා: බදු බැර** | | | | |
| | | රු. | | |
| ආර්ථික සේවා ගාස්තු | | 3,580,000 | | |
| ඉදිරියට ගෙන ආ මති මාත්‍ර බදු බැර | | 560,000 | | |
| පොලිය මත රඳවා ගැනීමේ බදු (435,000 x 5%) | | 21,750 | | |
| කුලී මත රඳවා ගැනීමේ බදු (480,000 x 10%) | | 48,000 | | |
| කාර්තුමය වාරික | | 1,000,000 | | 5,209,750 |
| **ඉතිරි ගෙවිය යුතු බද්ද / (වැඩිපුර ගෙවූ බද්ද)** | | | | **(1,516,722)** |

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම**

**ආදායම් බද්ද ගණනය කිරීමට සටහන්**

2018/2019 තක්සේරු වර්ෂය

(1.1) **මූල්‍ය පිරිවැය**

| | | |
|---|---|---|
| මූල්‍ය පිරිවැය | B | 6,597,000 |
| **දේශීය ආදායම් පනතේ 18 වන වගන්තිය යටතේ තුනී ප්‍රාග්ධනීත කිරීම සඳහා ගැලපුම** | | |
| නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය | | 12,000,000 |
| සංචිත | | 1,850,000 |
| | A | 13,850,000 |
| **මූල්‍ය සාධන පත්‍ර සඳහා අදාළ කළ හැකි මූල්‍ය පිරිවැය** | | |
| මූල්‍ය සාධන පත්‍ර සඳහා ගෙවිය යුතු මුදල | C | 42,380,000 |
| **ඉඩදෙන උපරිම මූල්‍ය පිරිවැය** | D = [(A x 3) / C ]x B | **6,467,800** |
| ඉඩ නොදෙන මූල්‍ය පිරිවැය ඊළඟ වර්ෂයට ඉදිරියට ගෙන ගියා | | 129,200 එකතු කළා |

(1.2) **ක්ෂය කළහැකි වත්කම් මත ප්‍රාග්ධන දීමනා:**

| **වත්කම් වර්ගය** | **මිලදීගත් වර්ෂය** | **ණය පදනම හෝ ඉදිරියට ගෙන ආ ලියා හළ අගය (රු.)** | **වර්ෂ ගණන** | **වර්ෂය සඳහා අයකිරීම (රු.)** |
|---|---|---|---|---|
| රසායනාගාර උපකරණ | 2018/19 | 1,000,000 | 5 | 200,000 |
| විදුලි ජනක යන්ත්‍ර | 2018/19 | 2,000,000 | 5 | 400,000 |
| කාර්යාල ලී භාණ්ඩ | 2018/19 | 450,000 | 5 | 90,000 |
| කළමනාකාර අධ්‍යක්ෂ සඳහා මෝටර් රථය | 2018/19 | 2,800,000 | ඉඩ නොදේ. | |
| මෝටර් වාහන | 2018/19 | 4,360,000 | 5 | 872,000 |
| දේශීයව සංවර්ධනය කළ මෘදුකාංග | 2018/19 | 420,000 | 8 | 52,500 |
| පරිගණක - කල් බදු | 2018/19 | 840,000 | 5 | 168,000 |
| ගොඩනැගිලි | 2015/16 | 12,465,000 | 10% | 1,246,500 |
| යන්ත්‍ර සූත්‍ර | 2016/17 | 2,400,000 | 33.33% | 800,000 |
| මෝටර් වාහන | 2016/17 | 5,400,000 | | |
| අඩු කළා: ඉවත් කිරීම් | | (2,800,000) | | |
| | | 2,600,000 | 20% | 520,000 |
| කාර්යාල උපකරණ | 2017/18 | 225,000 | 33.33% | 75,000 |
| | | | | **4,224,000** |

(1.3) **ක්ෂය කළ හැකි වත්කම් මත තක්සේරු කළ හැකි ගාස්තුව හෝ තුලනය කිරීමේ දීමනාව:**

| **විස්තරය** | **වත්කමේ පිරිවැය** | **අත්පත්කරගත් වර්ෂය** | **ප්‍රතිෂ්ඨාව** | **ලියා හළ අගය** | **තක්සේරු කළ හැකි ගාස්තුව** |
|---|---|---|---|---|---|
| මෝටර් වාහන | 2,800,000 | 2016/2017 | 1,750,000 | 1,680,000 | 70,000 |

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම**

**ආදායම් බද්ද ගණනය කිරීමට සටහන්**

2018/2019 තක්සේරු වර්ෂය

**2. ආයෝජන ආදායම ගණනය කිරීම:**

| | සටහන් | රු. | රු. |
|---|---|---|---|
| කුලී ආදායම | | 480,000 | |
| අඩු කලා : වියදම් - තින්ත ගැම | | (145,000) | |
| | | 335,000 | |
| පොලී ආදායම | | 435,000 | |
| ලාභාංශ ආදායම | | 215,000 | |
| ලැයිස්තුගත කොටස් ආයෝජන විකිණීමෙන් ලාභය | | 468,000 | |
| ඉඩම විකිණීමෙන් ලත් ලාභය | 2.1 | 2,000,000 | 3,453,000 |
| **අඩුකලා : නිදහස් / අවසාන රඳවා ගැනීමේ ගෙවීම්** | | | |
| ලාභාංශ ආදායම | | 215,000 | |
| ලැයිස්තුගත කොටස් ආයෝජන විකිණීමෙන් ලද ලාභය | | 468,000 | (683,000) |
| **ආයෝජන ආදායම** | | | **2,770,000** |

**(2.1) ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලාභ / අලාභ:**

| **විස්තරය** | **පිරිවැය / 2017 සැප්තැම්බර් 30 දිනට වෙළෙඳපල වටිනාකම (රු.)** | **ප්‍රතිෂ්ඨාව (රු.)** | **ලාභ / අලාභ (රු.)** |
|---|---|---|---|
| ඉඩම | 28,000,000 | 30,000,000 | 2,000,000 |

**3. පහළ අනුපාත යටතේ බද්දට යටත්වන ව්‍යාපාර ආදායම:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත අනුව, මූලිකවම භාණ්ඩ හා සේවා අපනයන ව්‍යාපාරයක නිරතව සිටින සමාගමක බදු අයකළ හැකි ආදායම 14% ක අනුපාතය යටතේ බද්දට යටත් වේ.

| **විස්තරය** | **රු.** |
|---|---|
| අපනයන ආදායම | 632,000,000 |
| දේශීය ආදායම | 84,000,000 |
| වෙනත් ආදායම් | 6,598,000 |
| දළ ආදායම | **722,598,000** |
| දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස අපනයන ආදායම | 87% |

--- --- ---